# තනි පද-17

වචන කිහිපයක් වචනුවට වයදිය හැකි තනි වචන තනි පද නම් වේ .

උදා :- අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

| | | | |
|---|---|---|---|
| 321) | ඉර පායන්නට පෙර නැගෙනහිර අහසේ පෙනෙන දීප්තිමත් පැහැය | - | අරුණෝදය |
| 322) | ආකාශයෙහි හැසිරෙන | - | ආකාශචාරී |
| 323) | නොකැඩී දිගට ම පවතින | - | අඛන්ඩ |
| 324) | යමකු විසින් සාදන ලද | - | කෘත්‍රිම |
| 325) | කුඹුරක නිරයෙන් වට කරන ලද කොටස | - | ලියැද්ද |
| 326) | කිසි දිනෙක එළි නොවන රහස | - | අභිරහස |
| 327) | දුන්නෙන් විදින්නා | - | දුනුවායා |
| 328) | අඳුර වැටී රැ බෝ වී ගෙන එන වේලාව | - | ගොම්මන |
| 329) | පොළවෙන් නැගෙන දුම | - | මීදුම |
| 330) | කැඩී ගිය යමක් නැවත අලුත්වැඩියා කිරීම | - | ප්‍රතිසංස්කරණය |
| 331) | උපතින් ම ලබන දක්ෂතාවය | - | සහජ දක්ෂතාවය |
| 332) | ගෙවල් බඳින්නා | - | පෙදරේරුවා |
| 333) | කෙනෙකු මිය ගොස් නැවත ඉපදීම | - | පුනරුත්පත්තිය |
| 334) | කාන්තාරයේ ඇති සරු බිම | - | ක්ෂේම භූමිය |
| 335) | සාමයෙන් සිටීමට කැමති | - | සාමකාමී |
| 336) | වසරක් පාසා පැවැත්වෙන | - | සාංවත්සරික |
| 337) | නාට්‍ය, චිත්‍රපට නරඹන්නා | - | ප්‍රේක්ෂකයා |
| 338) | සවන් දෙන තැනැත්තා | - | ශ්‍රාවකයා |
| 339) | දේශයට ආදරය කරන | - | දේශප්‍රේමී |
| 340) | සිතේ ඇති වන හැඟීම | - | සිතුවිල්ල |